**පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය - 2025**

**-------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය (“ආයතනය”) 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 23 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 107 (5) උපවගන්තිය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ආයතනයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

මතය සඳහා සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත්

කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකබව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- ආයතනය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- ආයතනය සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39 (4) | එකතුව රු.132,397,880 ක් වූ අරමුදල් 11ක් මෙම පනත ක්‍රියාත්මක වන දින සිට වසරක් ඇතුළත එනම් 2025 අගෝස්තු 07දිනට පෙර විසුරුවා හැරීමට හෝ ව්‍යවස්ථාපිත අරමුදල් බවට පරිවර්තනය කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | ආයතනික ව්‍යවස්ථාපිත අරමුදල් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත සියළු වාර්තා 2025 වර්ෂයේදී යොමුකර ඇති බව. | මෙම අරමුදල් විසුරුවා හැර අදාළ ගනුදෙනු විශ්වවිද්‍යාල අරමුදල මඟින් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ 570 | අදාළ කාර්යය නිම වී වර්ෂ 02ක් ඉක්ම වූ එකතුව රු.1,084,789 ක් වූ රඳවා ගැනීම් තැන්පතු 07ක් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | තැන්පතු නිදහස් කර ගැනීමට කටයුතු කරන ලෙස අදාළ කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කර එසේ නිදහස් කර නොගන්නා රඳවා ගැනීම් වෙතොත් ඒවා ආයතනික ආදායමට එකතු කිරීමට පියවර ගැනීමට කටයුතු කර ඇති බව . | වර්ෂ 2 ඉක්මවූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVII වැනි පරිච්ඡේදයේ 3 ඡේදය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 870 | රජයේ නිලධරයෙකුට ලැබෙන තෑගි බෝග හුදෙක් රාජ්‍ය නියෝජිතයෙකු වශයෙන් තමා දරන තත්ත්වය නිසා ලැබුණු තෑගි බෝග ලෙස සැලකිය යුතු අතර විදේශීය රාජ්‍ය නායකයෙකුගෙන් හෝ නියෝජිතයෙකුගෙන් තෑගි බෝගාදියක් ලැබුණ හොත් ඒ බව විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත වාර්තා කර ආයතනයට ලද පරිත්‍යාගයක් ලෙස සලකා ගිණුම්ගත කලයුතු වේ. එහෙත් ආයතනයේ අධ්‍යක්ෂ ස්වාමීන් වහන්සේට 2023 වර්ෂයේදී ලද රු.6,628,501 ක පරිත්‍යාගයක් ස්ථිර කාර්යමණ්ඩලය සඳහා සෞඛ්‍ය රක්ෂණ අරමුදල් ගිණුම නමින් ගිණුමකට බැර කර තිබුණි. තැම්පතුවල ආයෝජනය මගින් ලද රු.2,405,600 ක පොළී ආදායම විධිමත් අනුමැතියකින් තොරව ආයතනයේ ස්ථිර කාර්යමණ්ඩල සාමාජිකයින් අතර බෙදාදී තිබුණි. | මෙම මූල්‍ය පරිත්‍යාගය හා අරමුදල පිහිටුවීම පිළිබඳව කළමනාකරණ මණ්ඩලය වෙත වාර්තා කර අනුමැතිය ලබාගෙන ඇති බව. | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව උක්ත පරිත්‍යාග ගිණුම්ගත කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2024 නොවැම්බර් 25 දිනැති ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලද භාණ්ඩ වැඩ හා උපදේශන නොවන සේවා සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 හා 4.1.3 (ආ) ඡේද | සෑම ප්‍රසම්පාදන අස්ථිත්වයක්ම මධ්‍යකාලීන අයවැය රාමුව අනුව වසර 3ක කාලයක් වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු අතර සවිස්තරාත්මක වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුළ අදාළ සෑම ප්‍රසම්පාදන පැකේජයක් සඳහාම ලංසු කැඳවීමේ දිනයේ සිට කොන්ත්‍රාත්තුව පිරිනැමීම හා අවසන් කිරීම දක්වා වූ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ,උප ක්‍රියාකාරකම් අදාළ පූර්ව හා/හෝ පසු සමාලෝචන ක්‍රියාකාරකම් කාලවකවානු සහිතව ඇතුළත් කළ යුතු වුවත් ආයතනය විසින් එසේ කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ආයතනික ප්‍රතිපාදන මත පදනම්ව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 ඡේදය ප්‍රකාරව කටයුතු කරනු ලබන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කාල වකවානු සහිත සර්වග්‍රාහී ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කල යුතුය. |
| (ඉ) 2021 නොවැම්බර් 16 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක 2021/01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) 3.2 ඡේදය | මූල්‍ය වර්ෂය අවසන්වී මාස ක් 5 ගතවීමට පෙර සහ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර වාර්ෂික කාර්යසාධනය සමාලෝචන රැස්වීම (APRM) පැවැත්විය යුතු වුවත් ආයතනය එපරිදි කටයුතු කර නොතිබුණි. | 2026 වර්ෂයේ අවසාන විගණන වාර්තාව ලැබුණු පසු, වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර වාර්ෂික කාර්යසාධන සමාලෝචන රැස්වීම පැවැත්වීමට කටයුතු කරනු ලබන බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධන සමාලෝචන රැස්වීම් පැවැත්විය යුතුය. |
| (ii) ඇමුණුම අංක 01 හි 01 ඡේදය | නියම කරන ලද අරමුණු වලට අනුකූලව ආයතනයේ වත්මන් තත්ත්වය සහ අපේක්ෂිත තත්ත්වය අතර වෙනස්කම් හඳුනාගැනීම සඳහා පරතර විශ්ලේෂණයක් සිදුකළ යුතු බවත් හඳුනාගත් පරතරයන් සුදුසු උපායමාර්ග සමඟ ආමන්ත්‍රණය කර තිබිය යුතු බවත් දක්වා තිබුණද උපායමාර්ග සැලැස්ම සකස් කිරීමේදී ආයතනය විසින් එසේ කටයුතු කර නොතිබුණි. | 2021 නොවැම්බර් 16 දිනැති හා අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීමට උපදෙස් දී ඇති බව. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව පරතර විශ්ලේෂණයක් සිදුකර ඊට අනුකූලව ක්‍රියාමාර්ග හඳුනා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය | | | |
| (i) ix පරිච්ඡේදය 3.1 හා 3.2ඡේද | 2025 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ආයතනයේ නිලධාරීන් 20 දෙනෙකු විසින් අවස්ථා 63කදී ඇඟිලි සලකුණු යන්ත්‍රය හෝ ලේඛනයක් භාවිතයෙන් පැමිණීම සහ පිටවීම සටහන් කර නොතිබුණි . එසේම අධ්‍යයන කාර්යමණ්ඩලයේ පැමිණීම හා පිටවීම ලේඛනයක්/ යන්ත්‍රයක් භාවිතයෙන් හෝ විධිමත් ලෙස තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් දීමනා ලෙස රු.74,243,916 ක් ගෙවීම් කර තිබුණි. | ආයතනයේ පැමිණීම සහ පිටවීම සටහන් කිරීමට ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිත කරන බවත් කාර්යාලයෙන් බැහැරව යන විට අවසන් ගමනාන්තයෙන් රාජකාරිය අවසන් වන අවස්ථා සහ විදුලිය බිඳ වැටීම්වලදී අදාළ යන්ත්‍රය ක්‍රියාවිරහිත වීම වැනි කරුණු මත මෙම තත්වය නිරීක්ෂණය වන අතර පැමිණීම සහ පිටවීම විධිමත්ව තහවුරු කරගැනීම හා පවත්වාගැනීමට සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් දැනුම්වත් කරන බව. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය අනුව පැමිණීම පිටවීම හා නිවාඩු සටහන් කිරීමට විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ii) x පරිච්ඡේදය 2 ඡේදය | 2025වර්ෂය තුළ අවස්ථා 31කදී නිලධාරීන් 20දෙනෙකු නිසි අවසරයකින් තොරව රාජකාරී වේලාව තුළ ආයතනයෙන් බැහැර ගොස් තිබුණි. | නිවැරදි කිරීමට උපදෙස් ලබාදී ඇති බව. | රාජකාරි වේලාව තුල පෞද්ගලික කටයුතු සඳහා බැහැර යන්නේනම් පෞද්ගලික නිවාඩු ලබාගත යුතු බවට ක්‍රමවේදයක් ස්ථාපිත කල යුතුය. |
| (උ) 2014 පෙබරවාරි 11 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2014 හි 4 (ii) ඡේදය | අන්තර් පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර පර්යේෂණ දීමනා ගෙවීම අනුමත කර නොගත් නිලධාරීන් 12 දෙනෙකු වෙත 2025 වර්ෂය තුළ රු.5,400,597 ක පර්යේෂණ දීමනා ගෙවීම් කර තිබුණි. | 2026 වර්ෂයේදී මාස 06 ක් තුළ පර්යේෂණ ප්‍රගතිය ලබා ගෙන ගෙවීම් කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | පර්යේෂණ දීමනා ගෙවීමට පෙර පර්යේෂණ වාර්තා අනුමත කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඌ) 2015නොවැම්බර් 17 දිනැති අංක 2015/15දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන | ආයතනය විසින් 2024 අධ්‍යයන වර්ෂයේ පවත්වන ලද උපාධි පාඨමාලා 08කට අදාළ විෂයයන් 58 ක විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට දින 137 සිට දින 218 දක්වා කාලයක් | 2026 වර්ෂය සඳහා කාල රාමුවක් සකස් කර ඒ අනුව කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛ ප්‍රකාරව මාස 03 කට පෙර විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට කටයුතු |

| | | |
|---|---|---|
| කොමිෂන් සභා චක්‍රලේඛ ලිපිය ගතකර තිබුණි. | | කල යුතුය. |

## 1.6 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2023ජූලි 18 දිනැති හා අංක SEC/2023/02 දරන චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව සේවා නියුක්තිකයන් හට සපයනු ලබන ගමනාගමන ප්‍රවාහන හෝ ඒ ආශ්‍රිත පහසුකම් සඳහා වූ ප්‍රතිලාභයේ සම්පූර්ණ වටිනාකම අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද ගණනය කිරීමේදී අදාළ කර ගත යුතු වුවත් ඊට පටහැනිව එම දීමනාවලින් සියයට 25 ක් පමණක් අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන තිබීම හේතුවෙන් නිලධාරියෙකුට අදාල අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද රු.33,347 ක් අඩුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කර තිබුණි. | 2026 අප්‍රේල් මාසයේ සිට සියයට 100 ක් ලෙස බදු අයකර ගැනීමට කටයුතු කරන බව. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව අත්තිකාරම් බද්ද ගණනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.18,222,835 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.49,809,582 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.31,586,747 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මේ සඳහා හුවමාරු නොවන ප්‍රාග්ධන ආදායම් ලැබීම් අඩුවීම සහ මෙහෙයුම් වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

( අ ) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මුළු ආදායම රු.308,128,434 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම රු.279,474,144 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මුළු ආදායම සියයට 10.25 කින් වර්ධනයවී තිබුණි.

( ආ ) සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රු.289,905,599 ක් වූ අතර 2024 වර්ෂයේ දී මුළු වියදම රු.229,664,562 ක් විය. ඒ අනුව මුළු වියදම සමාලෝචිත වර්ෂයේදී 2024 වර්ෂයට සාපේක්ෂව රු.60,241,037 ක් එනම් සියයට 26.23 කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අලෙවි කල හැකි පොත් ප්‍රමාණය පිළිබඳ නිසි ඇගයීමක් හෝ සැලසුමකින් තොරව ආයතනය විසින් 2024 වර්ෂය හා ඊට පෙර මුද්‍රණය කරන ලද පොත් 22 කට අදාල පිරිවැය රු. 314,027 ක් වූ පිටපත් 790 ක් සහ 2025 වර්ෂය තුළ මුද්‍රණය කරන ලද පොත් 07 කට අදාළ පිරිවැය රු.682,383 ක්වූ පිටපත් 820 ක්ද අලෙවි කර ගත නොහැකිව නිෂ්කාර්ය වී තිබුණි. | මෑත කාලයේ පිටපත් 150 ක් පමණක් මුද්‍රණය කරන අතර, මෙම ග්‍රන්ථ මුද්‍රණය කිරීමේ ප්‍රධාන අරමුණ අලෙවියෙන් මූල්‍යමය ලාභ ඉපයීම පමණක් නොවන අතර විද්වත් ශාස්ත්‍රීය ප්‍රකාශනයක ආයතනික වටිනාකම හා දායකත්වය ප්‍රමුඛ වීම බව. | අලෙවි පිළිබඳ විධිමත් පුරෝකථනයක් සිදුකර පොත් මුද්‍රණය කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්වයං මූල්‍ය උත්පාදන පාඨමාලා වන බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවෙන් (සිංහල) හා බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති (සිංහල) පාඨමාලාවෙන් ලද ආදායමෙන් භාවනා සහ උපදේශන මධ්‍යස්ථානය නඩත්තු කිරීම සඳහා පසුගිය වසර තුනක කාලය තුළ රු.1,118,982 ක් වෙන් කර ඇතත් උපදේශන ඒකකය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.840 ක වියදමක් දරා තිබීම පමණක් සිදුකර තිබුණු බැවින් උක්ත වෙන් කිරීම් අදාළ අරමුණු සඳහා ඵලදායී ලෙස භාවිතා කර නොතිබුණි. | 2026 වර්ෂය සඳහා භාවනා ඒකකයෙහි ප්‍රායෝගික භාවනා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සම්බන්ධීකාරකවරයෙකු පත් කර ඇත. ඒ අනුව අදාළ වැඩසටහන සඳහා සැලැස්මක් සහ අයවැය වාර්තාවක් සකස් කර අදාළ බලාධිකාරී අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. විධිමත් අනුමැතිය ලද විගස අදාළ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත බව. | වෙන්කිරීම් අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවිය යුතුය. |

### 3.3 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රජයේ වාහන නඩත්තු කිරීම සම්බන්ධයෙන් වන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.3 ඡේදය ප්‍රකාරව මාසික ඉන්ධන භාවිතය හා සම්බන්ධයෙන් වන තොරතුරු අදාළ ආකෘතිය අනුව පවත්වාගෙන යා යුතු බව දක්වා ඇතත් එසේ කටයුතු කර නොතිබුණි. | අදාළ ආකෘතිය අනුව යාවත්කාලීන කිරීමට උපදෙස් දී ඇති බව. | චක්‍රලේඛයේ සඳහන් තොරතුරු පවත්වාගෙන යාමේ ආකෘතියට අනුව තොරතුරු පවත්වා ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අරමුණු හා සංයුක්ත සැලැස්ම

උසස් අධ්‍යාපනයට ඇති අවස්ථා සහ ප්‍රවේශය වැඩි කිරීම, ථේරවාදී බෞද්ධ දර්ශනය ඉගැන්වීමේ මූලිකම උසස් අධ්‍යාපන ආයතනය බවට පත්වීම, ප්‍රවර්ධනය කරන ලද සදාචාරාත්මක හා අධ්‍යාත්මික වටිනාකම් සමඟ රැකියා හැකියාව වැඩිදියුණු කිරීම සහ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා අභ්‍යන්තර පාඨමාලා දහසයක් සහ ස්වයං මූල්‍ය පාඨමාලා හයක් ආයතනය විසින් පවත්වා ගෙනගොස් තිබුණි.

2025 වර්ෂයේදී ශාස්ත්‍රපති (දේශීය) උපාධිධාරීන් 451 දෙනෙකු ද ශාස්ත්‍රපති (විදේශ) උපාධිධාරීන් 41 දෙනෙකු ද, පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරීන් 84 දෙනෙකු ද දර්ශනපති උපාධිධාරීන් 16 දෙනෙකු ද ලෙස උපාධිධාරීන් 592 දෙනෙකු ආයතනය විසින් බිහිකර ඇත.